---

**වියදම් ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

---

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) සංවර්ධන වැඩසටහන්, ව්‍යාපෘති හා ව්‍යවස්ථාපිත අණ පනත්වලින් පැවරී ඇති බලතල හා වගකීම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කටයුතු රජයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

(ආ) දිස්ත්‍රික්කය තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාමටත්, ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමටත්, ආරක්ෂක අංශ සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.

(ඇ) වෙනත් රාජ්‍ය ආයතනවල නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම සහ රාජ්‍ය ආදායම් එකතු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

| | | | |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල | (ජ) | රිදීගම |
| (ආ) | පන්නල | (ණ) | මල්ලවපිටිය |
| (ඇ) | වාරියපොල | (ත) | මාස්පොත |
| (ඈ) | ඉබ්බාගමුව | (ද) | බිංගිරිය |
| (ඉ) | ගනේවත්ත | (ධ) | නාරම්මල |
| (ඊ) | මහව | (න) | පොල්පිතිගම |
| (උ) | ගිරිබාව | (ප) | ගල්ගමුව |
| (ඌ) | අඹන්පොල | (බ) | ඇහැටුවැව |
| (එ) | පඩුවස්නුවර (බටහිර) | (භ) | නිකවැරටිය |
| (ඒ) | පඩුවස්නුවර (නැගෙනහිර) | (ම) | කොබෙයිගනේ |
| (ඔ) | කුලියාපිටිය (බටහිර) | (ය) | රස්නායකපුර |
| (ඕ) | කුලියාපිටිය (නැගෙනහිර) | (ර) | කොටවෙහෙර |
| (ක) | අලව්ව | (ළ) | වීරඹුගෙදර |
| (ග) | මාවතගම | (ල) | බමුණාකොටුව |
| (ච) | පොල්ගහවෙල | (ව) | උඩුබද්දාව |

**1.3 විගණන විෂය පථය**

------------------------

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. කළමනාරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 30 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දෙමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණ**

----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.15 දක්වා ඡේදයන්වල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම**

------------------

**(i). මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා දස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,384,104,729 ක් වූ අතර, වර්ෂය අවසාන වන විට ඉන් රු.1,360,400,579 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.23,704,150 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.71 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 913,050,000 | 1,339,525,689 | 12,907,230 | 0.96 |
| මූලධන | 32,300,000 | 44,579,040 | 10,796,920 | 24.22 |
| එකතුව | 945,350,000 | 1,384,104,729 | 23,704,150 | 1.71 |

(ii). **අයවැය විචලනය**

- වැය විෂයයක සඳහා සළසා තිබුණු රු.225,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.
- 2011 දෙසැම්බර් 31 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, එකතුව රු.700,000 ක ප්‍රතිපාදන අවුරා තැබීමෙන් පසුව වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 සිට සියයට51 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.
- වැය විෂයයන් 06 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් සලසාගෙන තිබූ ප්‍රතිපාදනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් මුදල් රෙගුලාසි 66 හා පර්පූරක ඇස්තමේන්තු වෙන් කිරීම් යටතේ ලබා ගැනීමෙන් පසු වෙනත් වැය විෂයයන් සඳහා මාරු කිරීමෙන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 27 දක්වා පරාසයකින් ඉතිරි කිරීම් සිදුකර තිබුණි.

(iii). **වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 23 කින් හා දෙපාර්තමේන්තු 17 කින් පිළිවෙලින් රු. 4,639,502,796 ක් හා රු. 3,326,683,518 ක් වශයෙන් එකතුව රු.7,966,186,314 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ලබා දී තිබුණු අතර, එයින් පිළිවෙලින් රු. 4,406,994,571 ක් හා රු. 3,216,717,331 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය රු. 232,508,225 ක් හා රු. 109,966,187 ක් වූ අතර එය ප්‍රතිපාදනයෙන් සියයට 5.01 ක් හා සියයට 3.31 ක් විය.

(ආ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 27201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 95,000,000 | 62,194,926 | 70,000,000 | 93,349,518 | 355,000,000 | 282,403,432 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). විෂය අංක 27201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.5,482,778 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii). චලනය නොවන හිඟ ණය ශේෂ 20 කට අදාලව රු.2,080,308 ක හිඟ ණය හා අත්තිකාරම් පැවති අතර, එම මුදල් අය කර ගැනීම පිළිබඳව පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(iii). මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව භාණ්ඩාගාර පොත් සමඟ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් සසඳා නොතිබුණි. භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර රු.120,600 ක වෙනසක් අනාවරණය වී තිබුණු අතර, භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙන් සිදු කරන ලද සාවද්‍ය බැර කිරීමක් ඊට හේතු වී තිබුණි. එය සාවද්‍ය ලෙස සමෘද්ධි දෙපාර්තමේන්තුව ලෙස ගිණුමේ දක්වා තිබුණ අතර, එකී සාවද්‍ය බැර කිරීම වර්ෂය අවසානයටද නිරවුල් කර නොතිබුණි.

(iv). සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 කට වැඩි සේවා ස්ථාන මාරුවීම්, විශ්‍රාම ගැනීම්, සේවයෙන් පහ කිරීම්, මියයාම හා සේවය අතහැර යාම වැනි හේතූන් නිසා අයකර ගැනීමට තිබුණු රු.1,800,983 ක හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

(v). 2005 අප්‍රේල් 25 දිනැති අංක 122 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2:2 ඡේදයට අනුව, සෑම මාසයක් අවසානයටම දේපළ ණය ගෙවීම් වෙනුවෙන් රජය විසින් දරනු ලබන ණය පොලියේ වෙනස හඳුනාගැනීම සඳහා භාණ්ඩාගාරය වෙත යැවිය යුතු මාසික වාර්තා පිළියෙල කර නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

------------------------

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.391,594,131 ක් වූ අතර, ඒ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). වර්ෂ 2 ක් ඉක්මවූ රු.8,146,478 ක් වූ තැන්පත සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii). වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.1,460,362 ක මුදල් අදාල කාර්යය භාරයයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(iii). අඩුපාඩු සම්පූර්ණ නොකිරීම, රැඳවුම් මුදල් ආපසු ලබා ගැනීමට උනන්දු නොවීම ආදී හේතු නිසා පොල්ගහවෙල, මාස්පොත, මාවතගම, පඬුවස්නුවර (බටහිර) හා අලව්ව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ව්‍යාපෘති 52 ක එකතුව රු.709,780 ක පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 1.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක.පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

ඉහත 1.6.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක් සඳහා පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූලව පිළියෙල කළ බවට තහවුරු නොවීය.

### 1.6.3 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 1.6.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දින හා 2004 පෙබරවාරි 20 දින 402 හා 402(1) අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජූලි 10 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

### 1.6.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.5 අභ්‍යන්තර විගණනය

(අ) ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණු අතර, එමගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගනුදෙනු පරීක්ෂා කර වාර්තා නිකුත් කිරීම සිදු කළද, ඒ සඳහා ජ්‍යෙෂ්ඨත්වය හා පලපුරුද්ද සහිත නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් යොදවනු වෙනුවට පුහුණුවන උපාධිධාරීන් වැඩි සංඛ්‍යාවක් යොදවාගෙන තිබුණි.

(ආ) 2012 වර්ෂය තුළදී කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 අතරින් කොටවෙහෙර, පන්නල, නාරම්මල, රිදීගම, කුලියාපිටිය (නැගෙනහිර) හා පොල්ගහවෙල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 හි පමණක් අභ්‍යන්තර විගණන අංශය විසින් ගනුදෙනු පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කර තිබුණි.

**1.6.6 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

අවම වශයෙන් මාස 03 කට වරක් හෝ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර වර්ෂයකට 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කමිටු රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි. එහිදී සාකච්ඡාවට ලක් කරන ලද කරුණු ක්‍රියාත්මක කිරීම මන්දගාමී ස්වරූපයක්ද ගෙන තිබුණි.

**1.7 වත්කම් කළමනාකරණය**

----------------------------

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

ජල බවුසරයක්, මෝටර් බයිසිකලයක් සහ යතුරු ලියන 02 ක් බොහෝ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක.පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, දිස්ත්‍රික් ලේකම් නිළ නිවසේ සහ සංචාරක නිවාසයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා 2013 අගෝස්තු 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වට්ටෝරු භාණ්ඩ මධ්‍යම රජයටද වයඹ පළාත් සභාවටද යන්න හඳුනාගත හැකිවන පරිදි සංකේත ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

---------------------------------------------------------

වෙනත් ආයතන සතුව තිබුණු සමහර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | සංඛ්‍යාව ඒකක ගණන හෝ ප්‍රමාණය | වටිනාකම රු. | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| (i) | වාහන | වයඹ පළාත් සභාව | 06 | - | 1989 සිට |
| (ii) | කම්හල් හා කාර්යාල උපකරණ | ආසියානු සංවර්ධන ව්‍යාපෘතිය | - | 200,000 | 1983 සිට |

(ඇ) **පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i). පොල්ගහවෙල පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි පර්චස් 380 විශාල ඉඩම හා ගොඩනැගිල්ල පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව සතු පර්චස් 120 ඉඩමකට හුවමාරු කරගෙන තිබුණද, එම හුවමාරු කටයුතු 2012 වර්ෂය අවසානයටද විධිමත්ව අවසන් කර නොතිබුණි.

(ii). පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව වෙතින් විධිමත් ලෙස හුවමාරු කටයුතු නොකරන ලද ඉඩමේ භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කරගෙන රු.27,321,739 ක් වැය කර නව ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

(iii). රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෞද්ගලික ඉඩම්වල ව්‍යාපෘති 11 ක් ආරම්භ කර තිබුණද, ඒවා රජයට පවරාගෙන නොතිබුණි.

(iv). පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයට පවරා නොමැති ඉඩමක ඉදිකර තිබූ සායන මධ්‍යස්ථානයක් අලුත්වැඩියා කිරීමට රු.1,490,546 ක් වැයකර තිබුණි.

(v). කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොදු කටයුතුවලට වෙන්කර ඇති හෝ රජයට අයත් බවට තහවුරු නොවූ ඉඩම්වල පොදු ළිං හා ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති 09 කට රජයේ දායකත්වය ලෙස රු.8,819,276 ක වියදමක් හා භුක්තිය බැහැර නොකරන ලද ඉඩම් කොටස් 03 ක පොදු ළිං 03 ක් හා උහම් පාසැල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු.2,973,889 ක් වියදම් කර තිබුණි.

(ඉ) **බේරුම් නොකළ බැරකම්**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ එකකට අඩු බැරකම්වල වටිනාකම රු.189,682 ක් විය.

1.8 **අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) **මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 110 | - | කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පාඩු හා හානි ලේඛනයක් පවත්වා නොතිබුණ. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 137 | 115,349 | පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2012 වර්ෂයේ වවුචර් 09 ක් සහතික කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 880 | 51,900 | • නිකවැරටිය ප්‍රාදේශය ලේකම් කාර්යාලයේ තනතුරු 08 කට අයත් නිලධාරීන්ගෙන් 08 දෙනෙකුගෙන් සහ රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තනතුරු 07 කට අයත් නිලධාරීන් 07 දෙනකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |
| | | 10,000 | • නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් 10 දෙනෙක් සහ රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීන් 66 කගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක.41/90 දරන චක්‍රලේඛය | - | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කට අනුයුක්ත කර තිබුණු වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |

**(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක.1AI/2002/02 චක්‍රලේඛය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක පරිගණක හා උපාංග සඳහා වෙනම ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**(ඇ) විමධ්‍යගත අයවැය චක්‍රලෙඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 2012 ජනවාරි 28 දිනැති අංක.1/2012 දරන චක්‍රලේඛය | - | පොල්ගහවෙල හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මූලධන වියදම් යටතේ මාතෘ සායන ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම, ළමා හා වැඩිහිටි නිවාස පහසුකම් වැඩිදියුණු කිරීම, සුළු වාරිමාර්ග හා ඇළවේලි සංවර්ධනය යන ව්‍යාපෘතිවලට ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) 2012 ජනවාරි 28 දිනැති අංක.1/2012 දරන චක්‍රලේඛය | 204,064 | ලියාපදිංචිය වසර 02 කට අඩු පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ස්වෙච්ඡා සංවිධාන 07 කට එකතුව රු.61,629 ක් වටිනා සහ රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ස්වෙච්ඡා සංවිධාන 05 කට රු.142,435 ක් වටිනා භාණ්ඩ හා උපකරණ ලබා දී තිබුණි. |

(ඉ) **වෙනත් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| (i) ශ්‍රී ලංකා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 3:9:1 ජේදය | 6,862,870 | රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංවර්ධන ව්‍යාපෘති 07 ක ඉදිකිරීම් භාරගෙන තිබූ ග්‍රාමීය සංවිධාන 07 ක් ඒවායේ ගිවිසුම් කාලය තුළ වැඩ නිමකර භාර දී නොතිබුණි. |
| (ii) වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ජුනි 16 දිනැති අංක.3/2009 දරන චක්‍රලේඛය | 3,600 | 2011 සැප්තැම්බර් 01 දින සිට 2012 ඔක්තෝබර් දක්වා දැව බලපත්‍ර ගාස්තු රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |

## 1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් පහත සදහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| විමධ්‍යගත, එක් ගමකට එක් වැඩසටහන, වැව් හා මාර්ග ප්‍රතිසංස්කරණය, ජල ව්‍යාපෘති ඇතුළු ව්‍යාපෘති 21 (ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09) | 16,160,863 | 2012.05.15 සිට 2012.12.03 දක්වා වූ දිනයන් | කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීම, ගිවිසුම්ගත නොවීම, ගිවිසුම්ගත සංවිධාන වැඩ ආරම්භ නොකිරීම විශේෂිත කාලගුණික තත්ත්වයන් (නියගය හා ගංවතුර) |

(ආ) **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සදහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර දමා තිබුණි.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2012 දෙසැම්බර් 31 දිනට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | |
| උඩුබද්දාව | (i) බිබිලදෙණිය ජල යෝජනා ක්‍රමය (එක් ගමකට එක් වැඩක්) | 414,960 | 2012.10.07 | - | ප්‍රමාණවත් තොරතුරු සහිත ඇස්තමේන්තුවක් ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය ඉදිරිපත් නොකිරීම. |
| - එම - | (ii) දුම්මලසූරිය මඩවලාගාර ගම්මානයට තෙකලා විදුලිය සැපයීම | - | - | - | විදුලි බල මණ්ඩලයට ගෙවීම් කර බිල්පත් ඉදිරිපත් නොකිරීම හා විදුලි බල මණ්ඩලයට රු.20,000 ක් ගෙවීමට සමිතිය එකඟ නොවීම. |
| රිදීගම | (i) කන්දෙගෙදර ප්‍රධාන මාර්ගයේ අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් කිරීම | 1,044,480 | 2012.10.31 | - | අයහපත් දේශගුණික තත්ත්වය |
| - එම - | (ii) අලවල-ගමමැද පාරේ ආරම්භක ස්ථානයේ බෝක්කුව සමඟ පාර කොන්ක්‍රීට් කිරීම | 1,061,020 | 2012.11.30 | - | අයහපත් දේශගුණික තත්ත්වය හා කාලය ප්‍රමාණවත් නොවීම |
| - එම - | (iii) කඩියාගම-ඇරුපොලකන්ද පාර හා ඇරුපොල වත්ත පාර කොන්ක්‍රීට් කිරීම | 1,043,138 | 2012.12.05 | - | කාලය ප්‍රමාණවත් නොවීම හා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රවාහනයට අපහසුතාවය |

(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| මාර්ග, පාලම්, බෝක්කු, ගොඩනැගිලි, සුළු වාරිමාර්ග, ජල ව්‍යාපෘති, පළාත් ආයෝජන ආදී ව්‍යාපෘති - 154 | 184,755,164 | 2012.06.22 සිට 2012.12.12 දක්වා දිනයන් | 2012.07.18 සිට 2012.12.31 දක්වා දිනයන් | ව්‍යාපෘති 21 ක් හැර ඉතිරි ව්‍යාපෘති 133 ක් සඳහා රු.74,393,167 ක් වියදම් දරා තිබුණි. | කාලගුණික තත්ත්වය, අමුද්‍රව්‍ය හිඟය, කාලය ප්‍රමාණවත් නොවීම, පුහුණු ශ්‍රමය හිඟය, ඉඩම් ගැටලු ප්‍රාදේශීය සභාව නියමිත දිනයට භාර නොදීම ආදී හේතු |

(ඈ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

නියැදි විගණන පරීක්ෂණවලදී පහත කරුණු අනාවරණය විය.

(i). 2012 ගම නැඟුම යටතේ තනා නිම කළ යුතු රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජල ව්‍යාපෘති 04 ක් හා විදුලි ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිවෙලින් ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට රු.3,958,690 ක් හා විදුලි බල මණ්ඩලයට රු.3,798,105 ක් ගෙවා තිබුණද, 2012 දෙසැම්බර් 31 දිනටද ඒවා නිමකර නොතිබුණි.

(ii). 2012 ගම නැඟුම යටතේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 02 ක ප්‍රජා ශාලා 02 ක් ඉදිකිරීම සඳහා රු.628,750 ක් වැයකර තිබුණද, 2012 දෙසැම්බර් 31 දින වන විටද ඒවායේ වැඩ නිමකර නොතිබුණ අතර, ආරම්භ කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘති 29 ක් සඳහා රු.195,000 ක අත්තිකාරම් ගෙවා තිබුණද, ඒවායේ වැඩ ආරම්භ කර නොතිබුණි. 2010 ගම නැඟුම යටතේ ඉටු කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘති 04 ක් සඳහා ප්‍රතිපාදිත රු.934,642 ක් ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් එම ප්‍රතිපාදන 2011 වර්ෂයේදී රජයේ ආදායමට ගෙන තිබුණි.

(iii). රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජංකුරේ ග්‍රාම නිලධාරී වසමේ පානීය ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා ශක්‍යතා හා ස්ථානීය විමර්ශන වාර්තාවට රු.33,600 ක් ගෙවා තිබුණද, පොළව අභ්‍යන්තරයේ ගලක් මතුවීම නිසා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණු අතර, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නාහල්ල ග්‍රාම නිලධාරී වසමේ පානීය ජල ව්‍යාපෘතියෙහි විමර්ශන හා ජලය පාරිභෝජනයට සුදුසු බවට වාර්තා ලබා ගැනීමට හා ළිඳෙහි ඉදිකිරීම් කටයුතුවලට රු.957,194 ක් වැයකර තිබූ අතර, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා සහ ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ඉහත කී වාර්තා නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කළ නොහැකිව තිබුණි.

(iv). කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විමධ්‍යගත අයවැය යටතේ නිම කළ යුතු රු.1,006,046 ක් වටිනා ව්‍යාපෘති 23 ක් අවිච්ජේද කර තිබුණි.

**(ඉ) කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

-----------------------------------------------------

උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම නැගුම ව්‍යාපෘතිය යටතේ 2012 මැයි හා ජූනි මාසවලදී ආරම්භ කළ යුතු මාර්ග 02 ක කුට්ටි ගල් ඇතිරීම සඳහා රු.1,956,734 ක ප්‍රතිපාදන මුදාහැර තිබුණද, ඒවා පිළිවෙලින් මාස 01 ක් හා මාස 02 1/2 ක් ප්‍රමාද වී ආරම්භ කර තිබුණි.

**(ඊ) භාණ්ඩ හා සේවා සැපයීම රහිතව මුදල් නිදහස් කිරීම**

---------------------------------------------------------

කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2012 විමධ්‍යගත අයවැය යටතේ සමාලෝචිත වර්ෂය තුළ රු.83,400 ක් වටිනා භාණ්ඩ මිලදීගෙන ගෙවීම් කර තිබුණද, වර්ෂය අවසානය වන විටත් එම භාණ්ඩ සැපයීම සිදුකර නොතිබුණි.

**1.10 කාර්ය සාධනය**

-----------------

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු / ක්‍රියාකාර සැලැස්මට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

-------------------------------------------------

නියැදියක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) <u>අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

- පාසැල් ගොඩනැගිල්ලක වේදිකාවේ වහලයට තාප පරිවාරක යෙදීමට රු.20,747 ගෙවා තිබුණද, තාප පරිවාරක යෙදා නොතිබුණි.
- දිවි නැගුම යටතේ කොට්ඨාශය තුළ රු.252,000 ක් වටිනා කිකිළි පැටවුන් බෙදා දී තිබුණද, නිසි එන්නත් ලබා නොදීම නිසා වැඩි ප්‍රමාණයක් මියගොස් ඇති අතර, බෙදා දුන් පැටවු අතර පිරිමි සතුන් විශාල ප්‍රමාණයක්ද ඇතුළත්ව තිබුණි.
- ඇස්තමේන්තුගත වටිනාකම රු.13,222,545 ක ව්‍යාපෘති 12 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසානයටත් නිමකර නොතිබුණි.

(ii) <u>රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

- කුරුවිකුලම විදුහලේ ප්‍රධාන ශාලාව රු.105,109 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණද, එහි වටපිල ස්ථාන 09 ක පිපුරුම් හා ස්ථාන 03 ක වලවල් සැදී තිබුණි.

- මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2012 හා ඊට පෙර විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන උපයෝගී කරගෙන මිලදීගෙන තිබූ රු.200,475 ක් වටිනා භාණ්ඩ බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි.

(iii) කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රු.682,654 ක් වටිනා පැල වර්ග හා මීමැසි පෙට්ටි 20,495 ක් ප්‍රතිලාභීන්ට ලබා දී තිබුණද, ඒවා බෙදා හැරීම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව නොතිබුණි.

(iv) <u>පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

- හාතිගම - මොරගොඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීමට රු.980,000 ක් වැයකර තිබුණද, එහි ප්‍රසාරණ මූට්ටු හා දෙවුර බොරළු පිරවීම සිදුකර නොතිබුණි.

- බුල්නෑව - හොරව්වැව මාර්ගයට කැටගල් ඇතිරීමට රු.980,000 ක් වැයකර තිබුණද, මාර්ගය තලය බොරළු දමා තැලීම සිදු නොකිරීමෙන් බොහෝ ස්ථාන ගලා බැස තිබුණි.

(v) පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.137,267 ක ගිවිසුම්ගත මුදලකට ඉටුකර තිබූ ඉහළ අමුණ ලැලි දැමීම හා පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තයේ පැතිබැම්ම ඉදි කිරීම සිදුකර නොතිබුණි.

(vi) රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 10 ක ගොඩනැගිලි 10 ක් ඉදිකිරීම් සිදුකර තිබුණද, ඒ සඳහා ප්‍රමාණවත් අක් මුදල් වෙන් නොකිරීම නිසා ඒවායේ වැඩ නිම කිරීමට නොහැකිව තිබුණි.

**1.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

--------------------------------------

**අක්‍රීය බැංකු ගිණුම්**

--------------------

පහත සඳහන් බැංකු ගිණුම් අක්‍රීයව පැවතුණි.

(i) 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 15 කට ආසන්න කාලයක් ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අක්‍රීය බැංකු ගිණුමක රු.20,322 ක ශේෂයක් තිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වර්ෂ 15 කට වැඩි කාලයක් අක්‍රීය බැංකු ගිණුම් 03 ක තිබූ රු.25,392 ක ශේෂය දැනට භාවිතා කරනු ලබන ජංගම ගිණුමට මාරු කිරීම සඳහා පොදු තැන්පත් ගිණුමට 2011 දෙසැම්බර් 18 දින බැරකර තිබුණද, එය සමාලෝචිත වර්ෂය අවසානයටද පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

1.12 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනයකට සමාලෝචිත වර්ෂය තුළදී මධ්‍යම රජය, පළාත් සභාව, ගම නැගුම යටතේ රු.298,495 ක් ඉන්ධන ලබාගෙන තිබුණද, ඉන්ධන දහනය අර්ධ වාර්ෂිකව පරීක්ෂා නොකිරීම නිසා එහි ඉන්ධන ශේෂ කිරීම ගැටලු සහගතව තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2012 ජුනි 11 දිනැති අංක.01/2012 දරන චක්‍රලේඛයෙන් 2012 ජනවාරි සිට අවලංගු කරන ලද 2011 ජුලි 13 දිනැති අංක.7/2011 චක්‍රලේඛයට අනුව, ගම නැගුම හා මග නැගුම ව්‍යාපෘති රාජකාරිවල නියැලීම වෙනුවෙන් සති අන්ත නිවාඩු දින වැටුප් ලෙස 2012 මාර්තු සිට සැප්තැම්බර් දක්වා අඹන්පොල ප්‍රාදේශීය ලේකම්වරයා රු.18,405 ක් සහ කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරී හා සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) වෙත 2012 ජනවාරි සිට නොවැම්බර් දක්වා එකතුව රු.112,788 ක් වැඩිපුර ගෙවා තිබූ අතර, එයින් රු.29,122 ක් කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 04 දෙනාගෙන් පමණක් ආපසු අය කරගෙන තිබුණි.

(ඇ) රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී සිදුකරන ලද මුදල් පරීක්ෂණයකදී නොගෙවූ වවුචර්වල වටිනාකම රු.58,540 ක් ලෙස ඉදිරිපත් කළද, එම වවුචර්වල වටිනාකම රු.42,776 ක් බව අනාවරණය වීමෙන් රු.15,764 ක මුදලක් අතිරික්තව ඇති බව අනාවරණය වූ අතර, ඊට හේතු වශයෙන් 2012 වර්ෂයේ ලබා නොගත් දීමනා හා ගමන් වියදම් බව හා එම වවුචර් අභ්‍යන්තර විගණන අංශයට ඉදිරිපත් කර ඇති බව සහ එම මුදල රජයේ ආදායමට බැර කර ඇති බව දන්වා තිබුණි. නොගෙවූ වවුචර් අභ්‍යන්තර විගණන අංශයට ලබාදුන් පදනම හා එම මුදල පොදු තැන්පත්වලට බැර නොකර ආදායමට බැර කිරීම ගැටලු සහගතව තිබුණි.

1.13 **පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත පරිදි පාඩු හා හානි සිදු වූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයක එන්ජිමෙහි ලිහිසි තෙල් නොමැතිව 2006 ජුනි 21 දින ධාවනය කිරීම නිසා එන්ජිම අභ්‍යන්තරයට සිදු වූ හානිය යථාවත් කිරීමට රු.338,370 ක් වැය වී තිබුණි. මෙම මුදල සම කොටස්වලින් ප්‍රාදේශීය ලේකම් වෙතින් හා රියදුරු වෙතින් අයකර ගැනීමට තීරණය වී තිබූ අතර, ප්‍රාදේශීය ලේකම් ගෙවිය යුතු රු.169,185 ක් ඔහු ගෙවා තිබූ අතර, රියදුරුගෙන් අයකර ගත යුතු කොටසින් රු.25,000 ක් මෙතෙක් අය වී නොතිබුණි.

(ආ) බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වාහනයක් 2012 මාර්තු 19 දින හදිසි අනතුරකට පත්වීම නිසා රු.391,445 ක අලාභයක් සිදුව තිබූ අතර, ඉන් රු.330,236 ක් රක්ෂණය මගින් ලැබී තිබුණද, ඉතිරි රු.61,209 ක් රියදුරුගෙන් අයකර ගැනීමට යෝජිතව තිබුණි. එහෙත් එම මුදල 2012 දෙසැම්බර් 31 දින වන විටද රියදුරුගෙන් අය කරගෙන නොතිබුණි.

(ඇ) මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත වාහනයක් 2009 පෙබරවාරි 05 දින හදිසි අනතුරකට භාජනය වීම නිසා රු.208,223 ක අලාභයක් සිදුව තිබූ අතර, එය වාහනය පැදවූ රියදුරුගෙන් අයකර ගැනීමට

තීරණය වී තිබුණි. මෙම අනතුරින් පසු වාහනය පැදවූ අනියම් රියදුරු සේවයට වාර්තා නොකිරීම නිසා අයකර ගත නොහැකිවී තිබුණි.

## 1.14 කළමනාකරණ දුර්වලතා

කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම්වල ජීවනෝපාය සංවර්ධන චක්‍රීය ණය අරමුදලක් ක්‍රියාත්මක කිරීමට රු.3,408,750 ක් ලැබී තිබුණද, එයින් රු.3,263,139 ක් සමාලෝචිත වර්ෂය අවසානයටද උපයෝගී කරගෙන නොතිබුණි.

## 1.15 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක තොරතුරු අනුව, සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 116 | 108 | 09 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 76 | 66 | 13 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 2,283 | 1,768 | 515 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 311 | 264 | 48 | 01 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 05 | 97 | - | 92 |
| | එකතුව | 2,791 | 2,303 | 585 | 97 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩුව තිබූ තනතුරු 585 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.

(ii). නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ එක් නිලධාරියෙකුද කුලියාපිටිය (බටහිර), ඉබ්බාගමුව හා මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තෘතියික මට්ටමේ නිලධාරීන් තිදෙනෙකුද, අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාථමික මට්ටමේ එක් සේවකයෙකුද අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව සේවයේ යොදවා තිබුණි.